# ප්‍රතිමිලදී ගැනීමේ මාස්ටර් ගිවිසුම

මෙහි පහත ඇතැම් තැනක "ගනුදෙනුකරු" යයි කියන ශ්‍රී ලංකාවේ යථාපරිදි සංස්ථාපනය කරන ලද කොළඹ 03, අංක 90, ගාලු පාර, සෙලාන් ටවර්ස්, 3 වන මහලේ තම ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සෙලාන් බැන්ක් පි එල් සි සමාගම බලයලත් ප්‍රාථමික අලෙවිකරුවෙකු සහ බලයලත් වානිජ බැංකුව සහ ...................................................... (පාරිභෝගිකයාගේ නම) ........................... (මෙහි පහත ඇතැම් තැනක පාරිභෝගිකයා යයි කියනු ලබන-

එක් අයෙක් "පාර්ශවය" සහ එක්ව ගැනීමේදී "පාර්ශවයන්")

1. **අර්ථ නිරූපණය**

මෙම ගිවිසුමේ අරමුණු සඳහා පහත නිර්වචනය කෙරෙන පද මගින් පහත දැක්වෙන අදහස් දරනු ඇත.

a. මෙම ගිවිසුමේ නියමයන් පරිදි කෙලවර කිරීමේ දැනුම් දීම ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලයක් ලෙසට සියලු ගනුදෙනු සිදුවිය යුතු, ප්‍රති මිලදී ගැනීමේ දිනය වන එවන් කෙලවර කිරීම දැනුම්දීමේ විශේෂිතව දක්වා ඇති දිනය "ත්වරණ දිනය" (Acceleration Date) ලෙසට අදහස් කෙරේ.

b. "බුන්වත්තා පතත" යන්නෙන් අදහස් කරන්නේ යම් පාර්ශවයක් පිළිබඳව (i) සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලිය තුලින් පියවිය යුතු ණය මුදල් පාර්ශවයට ගෙවිය නොහැකි වීම. (ii) පාර්ශවයේ දේපල වලින් භෞතික කොටසක් හෝ පාර්ශවයේ ප්‍රතිසම නිලධාරියෙකු හෝ ලැබුම්කරුවෙකු හෝ ඇවරකරුවෙකු පරිපාලකයෙකු හෝ භාරකාරයෙකු පත් කිරීම අනුමත කරන එකඟතාවය පල කරන හෝ සොයන හෝ (iii) ගොනු කර දින 30 ක කාලය තුලදී අවර්තියට හෝ නිශ්ප්‍රභා කිරීමකට ලක් නොවූ යම් ප්‍රතිසම පටිපාටිකරයක් හෝ පාර්ශවය විසින් නිමා කිරීම හෝ වෙනත් බුන්වත්තව හෝ හන්කොලොත්බාවය කියාපාන ඉදිරිපත් කිරීමක් හෝ පාර්ශවය පිළිබඳව පෙත්සමක් ඕනෑම උසාවියක හෝ ඕනෑම අනුයෝජිතත්වයක මගින් කියාපෑමයි.

c. මෙම ප්‍රති මිලට ගැනීමේ මාස්ටර් ගිවිසුම ඇතුලු එහිම කොටසක් වන සියලුම ගනුදෙනු "ගිවිසුම" (Agreement) ලෙසට අදහස් කෙරේ.

d. 7 වන වගන්තියේ එයට ආරෝපණය කෙරෙන තේරුම සංශෝධිත ප්‍රති මිලදී ගැනීමේ මිල (Amended Repurchase Price) යන්නෙන් අදහස් වේ.

e. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සඳහා ගනුදෙනුකරු විවෘතව ඇති දිනය ව්‍යාපාර දිනය (Business day) ලෙස අදහස් කෙරේ.

f. සි ඩී එස් එකවුන්ට් (CDS Account) ලෙසට අදහස් කරන්නේ අදාල වන සුදුසු බවයේ සුරැකුම් තැන්පත් කර ඇති හෝ තැන්පත් කිරිම සඳහා පාරිභෝගිකයා විසින් මධ්‍යම භාණ්ඩාගාරය සමඟ පවත්වන ගිනුම වේ.

g. "ස්ථිර කිරිම" (Confirmation) යන්නෙන් අදහස් කරන්නේ මෙහි ඇමුණුම් I ලෙස පෙන්වා ඇති ආකෘතිය මඟින් ගනුදෙනුකරු විසින් ප්‍රමාණවත් ලෙස නිකුත් කල සනාථ කිරිමය.

h. "ඩිෆෝල්ට් ප්‍රතිශතය" (Default Rate) යන්නෙන් අදහස් කරන්නේ SLIBOR ධන 2% වාර්ෂික පොලියයි.

i. සුදුසුකම් ඇති සුරැකුම්පත් (Eligible Security) යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා රජය හෝ ශ්‍රී ලංකා මහා බැංකුව මඟින් නිකුත් කල ඕනෑම බිල්පත් පොරොන්දු පත් හෝ සුරැකුම් සහ මෙම අරමුණු සඳහා යෝග්‍ය සුරැකුමක් ලෙසට සංස්ථාපනය කලහැකි ගනුදෙනුකරු විසින් පාරිභෝගියකයා විටින් විට දැනුවත් කරන වෙනත් සුරැකුම්

j. ඒකාකාර සුරැකුම්පත් (Equivalent Securities) යන්නෙන් අදහස් කරන්නේ මෙහි අන්තර් වාක්‍ය 6 ට අනුකූලව මිලදී ගන්නා ලද සුරැකුම්පත් සඳහා එම වර්ගයේම සුරැකුම්පත්, නාම මාත්‍ර අගය, හැඳින්විම හා වටිනාකම සහිත සුරැකුම්පත් ආදේශ කිරිම ආශ්‍රිත ඕනෑම තත්වයකි.

k. "හෙයාර්කට්" (Haircut) යන්නෙන් අදහස් කරන්නේ දෙපාර්ශවය අතර ඇති කරගත් එකඟතාවය පරිදි සුදුසුකම් සහිත සුරැකුම්පත් සඳහා වෙළඳපොල අගයෙන් යම් වට්ටමක් ලබා දිමය.

l. "ආදායම" (Income) යන්නෙන් අදහස් කරන්නේ මිලදීගත් සුරැකුම්පත් සඳහා (ප්‍රාග්ධනයට අදාල යම් ගෙවීමක් හැර) යම් කුවිතාන්සි, පොලිය, ලාභාංශ හෝ ඒ මත නිකුත් කරන්නා විසින් සිදුකරන වෙනත් ආකාරයේ ගෙවීමක්ය.

m. "එල්කේආර්" (LKR) යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා රුපියල් වේ.

n. "වෙළඳපොළ අගය" (Market Value) යන්නෙන් අදහස් කරන්නේ ඕනෑම වර්ගයේ සුරැකුම්පත් පිළිබඳව ගනුදෙනුකරු විසින් එයට අදාල වන යම් හෙයාර්කට් ද සැලකිල්ලට ගනිමින් සාධු සිතින් නිශ්චය කල (වගන්ති 7 පිළිබඳ අරමුණු උදෙසා වෙළඳපොල අගය නිශ්චය කිරීමේදී කිසිදු හෙයාර්කට් බලපෑමක් අදාල නොවන ලෙසට) එවන් සුරැකුම් වල පවත්වන අගයයි.

o. "පැහැර හැරීමක් පිළිබඳ දැනුම් දීම" (Notice of Default) යන්නෙන් අදහස් කරන්නේ පැහැර හැරිය පාර්ශවය වෙත පැහැර නොහැරිය පාර්ශවය විසින් එවන් පැහැර හැරීමක් සිදු වී ඇති බව දැනුම් දීමයි. එවන් දැනුම් දීමක අදාල ත්වරණ දිනය සහ අවසන් කිරීමේ ගෙවීම් දිනයද විශේෂිතව දැක්වේ.

p. "කෙලවර කිරීමේ දැන්වීම සිදුවීම" (Notice of Termination Event) යන්නෙන් අදහස් කරන්නේ පැහැර නොහැරිය පාර්ශවය මගින් අනිත් පාර්ශවය වෙත කෙලවර කිරීමේ සිද්ධියක් ඇතිවීම පිළිබඳ දැනුම්දීමයි. එවන් දැනුම් දීමක අදාල ත්වරණ දිනය සහ අවසන් කිරීමේ ගෙවීම් දිනයද විශේෂිතව දැක්වේ.

q. "මිලදී ගැනීමේ දිනය" (Purchase Date) යන්නෙන් අදහස් කරන්නේ අදාල සනාථ කිරීමේ එලෙසට විශේෂිතව දක්වා ඇති දිනයයි.

r. "මිලදී ගැනීමේ මිල" (Purchase Price) යන්නෙන් අදහස් කරන්නේ අදාල සනාථ කිරීමේ එලෙසට දක්වා ඇති මිලයි.

s. "මිලදී ගත් සුරැකුම්පත්" (Purchased Securities) යන්නෙන් අදහස් කරන්නේ අදාල සනාථ කිරීමේ එලෙසට විශේෂිතව දක්වා ඇති සුරැකුම් වන අතර මෙහි උප වගන්ති 6 හි කරුණු වලට අනුකූලව ආදේශනය කරන ලද යෝග්‍ය සුරැකුම් ද ඇතුලත් ලෙසට අනුගහනය කෙරේ.

t. "ප්‍රති මිලදී ගැනීමේ දිනය" (Repurchase date) යන්නෙන් අදහස් කරන්නේ අදාල සනාථ කිරීමේ එලෙසට දක්වා ඇති දිනය වේ.

u. "ප්‍රති මිලදී ගැනීමේ මිල" (Repurchase Price) යන්නෙන් අදහස් කරන්නේ අදාල සනාථ කිරීමේ එලෙසට දක්වා ඇති මිල වේ.

v. "ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුව" (Repurchase Transaction) යන්නෙන් අදහස් කරන්නේ ගනුදෙනුකරු විසින් පාරිභෝගිකයා සමඟ එකඟ වූ දිනයක (Purchase

Date) එකඟ වූ මිලට (Purchase Price) යෝග්‍ය සුරැකුම්පත් විකිණීමට එකඟවීම මත කෙරෙන වෙළඳ කටයුත්ත වන අතර පාරිභෝගිකයා විසින් අදාල ස්ථිර කිරීම් හි දක්වා ඇති මෙහි අඩංගු අනුදේශයන්ට යටත්ව එකඟ වූ දිනයක (The repurchase date) එකඟ වූ මිලකට (The repurchase price) ගනුදෙනුකරු වෙත ඒකාකාර සුරැකුම් විකිණීමට එකඟ වීම.

w. ප්‍රතිනමන ප්‍රති මිලදී ගැනීමේ ගණුදෙනුව (Reverse Purchase Transaction) යන්නෙන් අදහස් කරන්නේ අදාල පාරිභෝගිකයා ගනුදෙනුකරු සමඟ එකඟ වූ පරිදි අදාල මිලදී ගැනීමේ දිනයේ අදාල මිලදී ගැනීමේ මිලට මිලදී ගෙන ඇති සුරැකුම් විකිනීමේ වෙළඳ කටයුත්ත වන අතර ගනුදෙනුකරු විසින් මෙහි අඩංගු අනුදේශයන්ට යටත්ව එකඟ වූ දිනයක අදාල ස්ථිර කිරීමේ දක්වා ඇති එකඟ වූ මිලකට පාරිභෝගික වෙත ඒකාකාර සුරැකුම්පත් විකිණීමට එකඟ වීම.

x. (SLIBOR) යන්නෙන් අදහස් කරන්නේ අදාල දිනයේ පෙ. ව. 11.00 ට රොයිටර් ස්ක්‍රීන් "SLIBOR" මත දිස්වෙන, බැංකු අතර ඇමතුම් මුල්‍ය වෙළඳපොලෙහි මාසයක කාලය තුල ලබාදෙන ප්‍රකාශිත අනුපාතය වන ශ්‍රී ලංකා බැංකු අතර ප්‍රකාශිත අනුපාතයයි.

y. "කෙලවර කිරීමේ දැන්වීම" (Termination Notice) යන්නෙන් අදහස් කරන්නේ මෙහි 7(iii) අන්තර් වාක්‍ය අනුගමනය කරමින් නිකුත් කල දැන්වීමයි.

z. කෙලවර කිරීමේ ගෙවීම් දිනය (Termination payment date) යන්නෙන් අදහස් කරන්නේ කෙලවර කිරීමේ දැන්වීමේ දක්වා ඇති ආකාරයට (මෙහි අනුදේශනයන්ට යටත්ව) මෙහි 7 වන වගන්තිය යටතේ අදාල මුදල ගෙවිය යුතු දිනයයි.

"ගනුදෙනුව" (Transaction) යන්නෙන් අදහස් කරන්නේ ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුව හෝ ප්‍රතිනමන ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවකි.

එයට අමතරව පාඨ සම්බන්ධයට අවශ්‍යය වේ නම් හැර මෙම ගිවිසුමේ :-

(අ) ඡේද සිරස්තල ඇතුලත් කර ඇත්තේ යොමු කිරීමේ පහසුව තකා පමණක් වන අතර එයින් මෙම ගිවිසුමේ විග්‍රහයට බලපෑමක් ඇති නොවේ.

(ආ) මෙහි ඡේදයන් වෙත යොමුව, මෙම ගිවිසුමේ ඡේදයන් වෙත යොමුව ලෙසට අර්ථ විග්‍රහ කරනු ලැබේ.

(ඇ) ඒක වචන අදහස හගවන සඳහන් කිරීම් හි බහු වචන අර්ථයද ප්‍රතිලෝම වශයෙන් ඇතුලත් වියයුතු වන අතර, පුරුෂ ලිංග අදහස හගවන සඳහන් කිරීම් හි ස්ත්‍රී ලිංග හා නපුංසක ලිංග ප්‍රතිලෝම වශයෙන් ඇතුලත් විය යුතු වේ.

(ඈ) යම් නීතිකරණයක් හෝ සහධාරි නීතිකරණයක් නිර්දේශනය කිරීම, විටින් විට සංසෝධනයට, නැවත පැනවීමට හෝ ආදේශ කිරීමට ලක්වන එම නීතිකරණය හෝ සහධාරි නිතිකරනය නිර්දේශ කිරීමක් ලෙසට අනුහනය කෙරේ.

**2. ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු**

i. පාර්ශවකරුවන් යම් ගනුදෙනුවකට ඇතුලත් වීමේදී ගනුදෙනුකරු විසින් මෙහි ඇමුනුම් I හී දක්වා ඇති ආකෘතිය භාවිතාකර එක් එක් ගනුදෙනුවේ අනුදේශයන් ප්‍රමානවත් ලෙසට දක්වන ස්ථිර කිරීමක් නිකුත් කල යුතුවේ.

ii. පාර්ශවයන් අතර ඇති කර ගන්නා ඕනෑම ගණුදෙනුවක්ම (ප්‍රකාශිතව වෙනත් ආකාරයකට එකග වීමේදී හැර) මෙම ප්‍රති මිලදී ගැනීමේ මාස්ටර් ගිවිසුමට යටත් වේ. එහිම කොටසක් ලෙසට එයින් පාලනය වේ. ඒ අනුව, එවන් සෑම ගණුදෙනුවක් සඳහාම අදාල ස්ථිර කිරීම් සියල්ල සහ මෙම ප්‍රති මිලදී ගැනීමේ මාස්ටර් ගිවිසුම එක්ව, එක් තනි ගිවිසුමක් සංස්ථාපනය කෙරේ.

(iii) 7 වන වගන්තියට යටත්ව

(අ) එක් එක් ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවක් සම්බන්ධවම

(A) මිලදී ගැනීමේ දිනයේ මිලදී ගැනීමේ මිල ලැබීමට යටත්ව ගනුදෙනුකරු විසින් අදාල සුරැකුම්පත් පාරිභෝගිකයාගේ CDS ගිණුමට බැර කිරීමට හෝ පාරිභෝගිකයාගේ අදාල මිලදී ගත් සුරැකුම්පත් පැවරීම, (පාරිභෝගිකයා හට ගණුදෙනුකරු සමග ගිණුමක් පවත්වන්නේ නම් එම ගිණුමෙන් හර කිරීම) කලයුතු වේ.

(B) ප්‍රති මිලදී ගැනීමේ දිනයේ, ගණුදෙනුකරු විසින් පාරිභෝගිකයාගේ CDS ගිණුමට අදාල මිලදී ගත් සුරැකුම් පත් හර කර, ගණුදෙනුකරු සමග පාරිභෝගිකයා පවත්වන මුදල් ගිණුමට ප්‍රති මිලදී ගැනීමේ මිල බැර කිරීම හෝ පාරිභෝගිකයා විසින් මේ සඳහා විශේෂිතව සඳහන් කර තිබෙන වෙනත් ගිණුමකට බැර කිරීම් හෝ පාරිභෝගිකයා සමග එකග වී ඇති ආකාරයට වෙනත් ආකාරයකට මුදල් ගෙවීම කල යුතු වේ.

(C) සෑම ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවක් තුලම ගනුදෙනුකරු විසින් මිලදී ගත් සුරැකුම්පත්, මිලදී ගත් දිනට, මිලදී ගත් මිලට පාරිභෝගිකයා වෙත අලෙවි කිරීම සහ

ගණුදෙනුකරු විසින් මිලදී ගත් සුරැකුම්පත්, මිලදී ගත් දිනට, මිලදී ගත් මිලට පාරිභෝගිකයාගෙන් මිලදී ගැනිම (මෙහි සැකයක් ඇතිවීම වලකා ගැනිම සඳහා) සහ එවන් මිලදී ගන්නා සුරැකුම්පත් පිළිබඳ පූර්ණ නෛතික සහ අර්ථදායි උනන්දුව පිළිවෙලින් මිලදී ගන්නා දිනයේ පාරිභෝගිකයා වෙත ද ප්‍රති මිලදී ගැනිමේ දිනයේ ගනුදෙනුකරු වෙත ද පැවරේ.

(b) එක් එක් ප්‍රති නමත ප්‍රති මිලදී ගැනිමේ ගනුදෙනුවක් සම්බන්ධවම :

(A) මිලදී ගන්නා දිනයේ

ප්‍රති මිලදී ගැනිමේ දිනයේ, ගණුදෙනුකරු විසින් පාරිභෝගිකයාගේ CDS ගිණුමට අදාල මිලදී ගත් සුරැකුම් පත් හර කර, ගණුදෙනුකරු සමඟ පාරිභෝගිකයා පවත්වන මුදල් ගිණුමට ප්‍රති මිලදී ගැනිමේ මිල බැර කිරිම හෝ පාරිභෝගිකයා විසින් මේ සඳහා විශේෂිතව සඳහන් කර තිබෙන වෙනත් ගිණුමකට බැර කිරිම් හෝ පාරිභෝගිකයා සමඟ එකඟ වී ඇති ආකාරයට වෙනත් ආකාරයකට මුදල් ගෙවීම කල යුතු වේ. ප්‍රති මිලදී ගැනිමේ දිනයේ මිලදී ගැනිමේ මිල ලැබිමට යටත්ව ගනුදෙනුකරු විසින් අදාල සුරැකුම්පත් පාරිභෝගිකයාගේ CDS ගිණුමට බැර කිරිමට හෝ පාරිභෝගිකයාගේ අදාල මිලදී ගත් සුරැකුම්පත් පැවරිම, (පාරිභෝගිකයා හට ගණුදෙනුකරු සමඟ ගිණුමක් පවත්වන්නේ නම් එම ගිණුමෙන් හර කිරිම) කලයුතු වේ.

(C) සෑම ප්‍රතිනමත ප්‍රති මිලදී ගැනිමේ ගනුදෙනුවක් තුලම පාරිභෝගිකයා විසින් මිලදී ගත් සුරැකුම්පත්, මිලදී ගත් දිනට, මිලදී ගත් මිලට ගණුදෙනුකරු වෙත අලෙවි කිරිම සහ පාරිභෝගිකයා විසින් මිලදී ගත් සුරැකුම්පත්, මිලදී ගත් දිනට, මිලදී ගත් මිලට ගනුදෙනුකරුගෙන් මිලදී ගැනිම (මෙහි සැකයක් ඇතිවීම වලකා ගැනිම සඳහා සහ එවන් මිලදී ගන්නා සුරැකුම්පත් පිළිබඳ පූර්ණ නෛතික සහ අර්ථදායි උනන්දුව පිළිවෙලින් මිලදී ගන්නා දිනයේ පාරිභෝගිකයා වෙත ද ප්‍රති මිලදී ගැනිමේ දිනයේ ගනුදෙනුකරු වෙත ද පැවරේ.

**3.** ආදායම

මිලදී ගන්නා ලද සුරැකුම්පත් සම්බන්ධව නිකුත් කරන්නා විසින් යම් ආදායමක් ("ඉන්කම් පේමන්ට්") ගෙවන්නේ නම් :

(1) ප්‍රතිමිලදී ගැනීමේ ගණුදෙනුවකට අදාළ වන මෙයට මිලදී ගැනීමේ දිනයට පසුව ඕනෑම අවස්ථාවක සහ ප්‍රතිමිලදී ගැනීමේ දිනයට පෙර එවන් ගෙවීමක් ගණුදෙනුකරු (සැකයක් ඇතිවීම වලකාලීම සඳහා) එවන් මුදලකට නියත වශයෙන්ම සුදුසුවිය යුතු වන අතර, එවන් ආදායම් ගෙවීමක් පාරිභෝගික

වෙත කෙරේ නම්, පාරිභෝගිකයා ද එසේ ලැබුන මුදලට සමාන මුදලක් ගනුදෙනුකරු වෙත, එම ව්‍යාපාර දිනයේම ගෙවීම කල යුතු වේ, එමෙන්ම

(2) ප්‍රතිමිලදී ගැනීමේ ගණුදෙනුවකට අදාළ වන මෙයට මිලදී ගැනීමේ දිනයට පසුව ඕනෑම අවස්ථාවක සහ ප්‍රතිමිලදී ගැනීමේ දිනයට පෙර එවන් ගෙවීමක් පාරිභෝගික (සැකයක් ඇතිවීම වළකාලීම සඳහා) එවන් මුදලකට නියත වශයෙන්ම සුදුසුවිය යුතු වන අතර, එවන් ආදායම් ගෙවීමක් ගණුදෙනුකරු වෙත කෙරේ නම්, පාරිභෝගික ද එසේ ලැබුන මුදලට සමාන මුදලක් ගනුදෙනුකරු වෙත, එම ව්‍යාපාර දිනයේම ගෙවීම කල යුතු වේ,

4. නියෝජනය

(1) පහත දැක්වෙන ආකාරයට පාරිභෝගිකයා ගනුදෙනුකරුට නිර්දේශනය කිරීම (පාරිභෝගිකයා ගනුදෙනුවකට යොමු වන සෑම දිනයකම එකී නිර්දේශනය පාරිභෝගිකයා විසින් නැවත සිදු කරන බවට අනුහනය කෙරේ.

(i) මෙම ගිවිසුමේ දක්වා ඇති අනුදේශයන් සහ අදාල සනාථ කිරීම් මත මෙහි පහත දැක්වෙන ගනුදෙනු සහ ගිවිසුම යටතේ යොමු වී එහි වගකීම් ඉටුකිරීම සඳහා පාරිභෝගිකයා හට පූර්ණ බලතල සහ අධිකාරිය ද අවශ්‍යය සියලුම අනුමැතියන් හා එකගතාවයන් ලබාගෙන ඇත.

(ii) මෙහි පහත දැක්වෙන ගිවිසුමට සහ එවන් ගනුදෙනු වෙත පාරිභෝගිකයා එකඟ වන්නේ ප්‍රධානියා ලෙසටය.

(iii) මෙම ගිවිසුම හෝ ඕනෑම ගනුදෙනුවක් යටතේ පාරිභෝගිකයා විසින් ගෙවන සියලුම මුදල් ප්‍රමාණයක් ගේ එකම අර්ථදායි හිමිකරු වන්නේ පාරිභෝගිකයාය.

(iv) පාරිභෝගිකයාගේ සව්‍යය නිගමනය එා ඇගයීම් හෝ, ගණුදෙනුකරුට නොබැදි ලබාගැනිමට අවශ්‍යය යයි අනුහනය කල පරිදි එවන් වෘතිය උපදෙස් ලබාගැනිමෙන්, පාරිභෝගිකයාගේ මුල්‍ය පරිවේෂණය අනුව ගණුදෙනුවකට ඇතුලත් වීමේ යෝග්‍යතාවය, ශක්‍ය මල්‍යමය වාසි සහ අවදානම, බදු සහ ගිණුම්කරණ අනුමිතිය පිළිබඳව පාරිභෝගිකයාට පූර්ණ වශයෙන් දැනුවත්ව ප්‍රමාණවත් අවබෝධය සහ පලපුරුද්ද ඇත.

v මෙම ගණුදෙනුව සහ මෙම ගිවිසුම පිළිබඳව පාරිභෝගිකයා ගණුදෙනුකරුගේ මතය හෝ උපදෙස් මත විශ්වාසය නොතබන අතර පාරිභෝගිකයාගේ පෞද්ගලික අගය විනිශ්චය (පාරිභෝගිකයා අවශ්‍යයි අනුහනය කල ආකාරයට පාරිභෝගිකයාගේ

වෘත්තිය උපදේශකවරුන්ගෙන් ලබාගත් උපදෙස් ඇතුලුව) මත එක් එක් ගණුදෙනුවට යොමු වීමට පාරිභෝගිකයා තිරණය කර ඇත.

(vi) මෙය යටතේ යම් ගනුදෙනුවක පාර්ශවකරුවෙකු වීමේදී ඇතිවන බදු අනුමිතියත් විශ්ලේෂණය කිරිමේ වගකිම ඉදිරියේදීද දැරිම පිළිබඳව පාරිභෝගිකයා සැහිමකට පත්ව ඇති බව

(2) පහත දැක්වෙන ආකාරයට පාරිභෝගිකයා වෙත ගනුදෙනුකරු විසින් නියෝජනය කෙරේ. (ගනුදෙනුවකට ඇතුලත් වන සෑම දිනකම ගනුදෙනුකරු විසින් මෙම නියෝජනය කිරිම ගනුදෙනුකරු නැවත සිදුකරන බවට අනුහනය කල යුතුවේ.)

(i) මෙම ගිවිසුමේ දක්වා ඇති අනුදේශසත් සහ අදාල සනාථ කිරිම් මත මෙහි පහත දැක්වෙන ගනුදෙනු සහ ගිවිසුම යටතේ යොමු වී එහි වගකිම් ඉටුකිරිම සඳහා පාරිභෝගිකයා හට පූර්ණ බලතල සහ අධිකාරිය ද අවශ්‍යය සියලුම අනුමැතියත් හා එකඟතාවයන් ද ලබාගෙන :

(ii) ගනුදෙනුකරු විසින් සිදුකරන ගනුදෙනු පිළිබඳ නැනහුරු ප්‍රමිතින් හෝ පවතින රෙගුලාසි උල්ලංඝණය කිරිමක් සිදුනොවන බව

5. <u>**බදු**</u>

වෙනත් ආකාරයක එකඟතාවයකට පැමිණීමේ දී හැර මෙය යටතේ කෙරෙන ඕනෑම ගණුදෙනුවකට අදාල සියළු ගෙවීම් පිළිබඳව යම් බදු අධිකාරියක් හෝ නීතිමය අවශ්‍යයතාවයක් මත බදු අඩුකිරිමක් හෝ රඳවා ගැනිමක් ක්‍රියාත්මක විමකදී හැර කිසිදු රඳවාගැනිමක් හෝ අඩුකර ගැනිමක් හෝ බදු අයකර ගැනිමේ අධිකාරියක් මඟින් තක්සේරු කිරිමකින් තොරව ගෙවීම කලයුතු වේ. එවන් පරිවේශනයක් තුල එවන් ගෙවීමක් කිරිමේ බැදිමක් ගෙවීම් කරන පාර්ශවයට ඇති නොවන අතර එවන් රඳවා ගැනිම් හෝ අඩු කිරිම් කිරිමෙන් පසුව ශුද්ධ මුදල ලබන පාර්ශවයට ගෙවිය යුතුවේ.

(6) <u>**අදේශනය කිරිම්**</u>

මිලදී ගත් දිනය සහ ප්‍රතිමිලදී ගැනීමේ දිනය අතර කාලය තුළ ප්‍රති මිලදී ගැනීමක් සම්බන්ධව පාරිභෝගිකයාගේ ලිඛිත කැමැත්තට යටත්ව (අදාළ සනාථ කිරිමට සම්බන්ධ කාලය තුළ දී හෝ ඉන් අනතුරුව ඕනෑම අවස්ථාවක ලබා ගත හැක.) මිලදී ගත් සුරැකුම් සඳහා වෙනත් යෝග්‍ය සුරැකුම් ආදේශනය කිරිම සඳහා වේ. කෙසේ වුවද ආදේශනය කරන දිනට, ආරම්භයේ දී ආදේශ කරන සුරැකුම්වල වෙළඳපොළ අගය අඩු තරමින් මිලදී ගත් සුරැකුම්වල අගයට සමාන අගයක්වත් දැරිය යුතු වේ. එවන් ආදේශනයක් පාරිභෝගිකයා

වෙත එවන් පහසුකම් ඇති සුරැකුම් පැවරීමෙන් කල යුතු වන අතර, අදාළ මිලදී ගත් සුරැකුම් වෙනුවට ආදේශ කරන ඒකාකාර සුරැකුම් ප්‍රමාණයක් සමගාමීව ගණුදෙනුකරු වෙත පැවරිය යුතු වේ. එසේ ආදේශනය කිරීමෙන් අනතුරුව එසේ ආදේශකල සුරැකුම් මිලදී ගත් සුරැකුම් ලෙසට අනුභනය කෙරෙන අතර එසේ ආදේශනය කල මිලදී ගත් ආරම්භක සුරැකුම්, මිලදී ගත් සුරැකුම් නිවාරණය කෙරේ. ඒ අනුව පාරිභෝගිකයාගේ ගිණුම හර හෝ බැර කිරීමේ අයිතිවාසිකම ගණුදෙනුකරු සතු වන අතර, පාරිභෝගිකයාගේ CDS ගිණුමෙන් පැවරීමක් ලබා ගැනීම හෝ පැවරීමක් කිරීම ද ඒ අනුව කල හැක.

7. පැහැර හැරීමක් සිදුවීම / සමාප්ත කිරීමක් සිදුවීම

(i) මෙම ගිවිසුම යටතේ පහත දැක්වෙන තත්වයන් පැහැර හැරීමක් සිදුවීමක් සේ සලකනු ඇත.

(අ) මෙහි අඩංගු යම් ගෙවීමක් හෝ බාරදීම් බන්ධනයක් ඉටුකිරීමට කුමන හෝ පාර්ශවයක් අසමත් වීම.

(ආ) මේ සම්බන්ධව පාර්ශවයක් විසින් ඉදිරිපත් කර ඇති යම් කිසි නියෝජනයක් සාවද්‍ය හෝ නොමග යවන සුළු නම්

(ඇ) යම් පාර්ශවයක් පිළිබඳව බුන්වත් පනතක් ඇති වීම.

(ඈ) කල් පිරීම හේතුවෙන් හැර, පාර්ශවයන් අතර වෙනත් ආකාරයේ ගිවිසුම් කර සම්බන්ධතාවයක් අවසන් කිරීම.

(ඉ) තනි පුද්ගලයෙකු වන පාරිභෝගිකයා මිය යාම, විකල් සිහිය හෝ අයෝග්‍ය බවට පත්වීම, සහ මරණය සිදුවීමේදී පාරිභෝගිකයා ගනුදෙනුකරු වෙත බන්ධනය වී පවතින හිඟ මුල්‍ය වගකීම් මරණය සිදුවී දින 30 ක් ඇතුලත ඉටු නොකිරීම.

(ii) පැහැර හැරීමට මුල් වූ පාර්ශව පැහැර හැරීම සිදුවීම සම්බන්ධයෙන් දැනුවත් වීමෙන් අනතුරුව පැහැර හැරීමට සම්බන්ධ නැති පාර්ශවය වෙත ඒ බව දැනුම් දීම කලයුතු වේ.

(iii) යම් පැහැර හැරීමේ සිදුවීම ඇති වූ කල පැහැර හැරීමට සම්බන්ධ නැති පාර්ශවයට අවසන් කිරීමේ දැනුම් දීමක් පැහැර හැරීමට මුල් වූ පාර්ශවය වෙත යැවිය හැක.

(iv) පැහැර නොහැරිය පාර්ශවය විසින් කෙලවරක් කිරීමේ දැන්වීමක් නිකුත් කිරීම අනුව, මෙහි පහත එක් එක් ගණුදෙනුව සඳහා ප්‍රති මිලදී ගැනීමේ දිනය ඇක්සලරේටඩ් දිනය

තෙක් ඇක්සලරේට් කල යුතුය. (මෙම දිනය, මෙහි අනුදේශයන්ට අනුකූලව කෙලවර කිරීමේ දැන්වීම ලැබුනේ යයි අනුහනය කෙරෙන දිනයට පෙර දිනයක් නොවිය යුතුය.) එක් එක් ගනුදෙනුව පිළිබඳව අදාළ වන ප්‍රති මිලදී ගැනීමේ දිනය ඇක්සලරේට් කිරීම ගණුදෙනුකරු විසින් සාධු සිතින් සලකා නිශ්චය කල මිල ගණනකට අනුව එක් එක් ගණුදෙනුව සඳහා ප්‍රති මිලදී ගැනීමේ මිල සංශෝධන කල යුතු වේ. (එවන් සංශෝධිත ප්‍රති මිලදී ගැනීමේ මිල "සංශෝධිත ප්‍රති මිලදී ගැනීමේ මිල" වේ.)

(v) ඒ ආකාරයට ඇක්සලරේෂන් දිනයක් ඇතිවීමේදී (A) ගණුදෙනුකරු නිශ්චය කල යුත්තේ (ආ) මෙහි පහත මිලදී ගෙන ඇති එක් එක් සුරැකුම්වල වෙළඳපොල අගය සහ (ආ) මෙහි පහත දැක්වන සංශෝධිත ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ (B) ගණුදෙනුවට සම්බන්ධ පාර්ශවයන්ගේ බැඳීම් ස්වයංක්‍රියාව අනුයෝග වීම.

(1) එකී මුදල් ප්‍රමාණය (අ) සියලු ප්‍රති මිලදී ගැනීම් ගණුදෙනු යටතේ වෙළඳපොල අගයේ එකතුව (ආ) ප්‍රතිනමනය කල - ප්‍රති මිලදී ගැනීම් ගණුදෙනු සියල්ල යටතේ සංශෝධනය කල ප්‍රතිමිලදී ගැනීමේ මිල ගණන්වල එකතුව (එවන් එකතුව "ගණුදෙනුකරුගේ ප්‍රමාණයන්" ලෙස හැඳින්වේ.) (ඇ) සියලුම ප්‍රතිනමනය කල ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු යටතේ වෙළඳපොල අගයන්ගේ එකතුව සහ (ඇ) ඕනෑම ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනුවක් යටතේ සංශෝධන ප්‍රතිමිලදී ගැනීම මිල එකතුව එකතුවට වඩා වැඩිවේ නම් (එවන් එකතුව "පාරිභෝගික අගය" ලෙස හැඳින්වේ.) පාරිභෝගිකයාගේ බැඳීමක් ලෙසට (මෙහි 7 (vi) වගන්තියට යටත්ව) කෙළවරක් කිරීම් ගෙවීම් දිනයේ එවන් අත්තිරික්කයට සමාන මුදලක් ගණුදෙනුකරු වෙත ගෙවීම.

(2) මෙහි 7(v)(B)(1) වගන්තිය මගින් තේරුම් කෙරෙන පරිදි පාරිභෝගිකයාගේ මුදල මෙහි 7(v)(B)(1) වගන්තිය මගින් තේරුම් කෙරෙන පරිදි ගණුදෙනුකරුගේ මුදලට වඩා වැඩි වේ නම් ගණුදෙනුකරුගේ බැඳීමක් ලෙසට මෙහි 7(vi) වගන්තියට යටත්ව කෙළවර කිරීමේ ගෙවීම් දිනයේ එවන් අත්තිරික්කයකට සමාන මුදලක් පාරිභෝකයා වෙත ගෙවීම.

(vi) (අ) මෙහි 7(v)(B)(1) වගන්තිය යටතේ පාරිභෝගිකයා විසින් එයට ගෙවිය යුතු යම් මුදලකට අබියස ගෙවිය යුතු සහ (ආ) පාරිභෝගිකයා විසින් ගෙවිය යුතු යම් මුදලක් අබියස 7(v)(B)(2) වගන්තිය යටතේ ඒ මගින් ගෙවිය යුතු, යන අවස්ථාවන්හිදී මෙම ගිවිසුම යටතේ එවන් වෙනත් මුදලක් පිළිබඳව යොමු වන්නේ ද එසේ නොවන්නේ ද යන්න නොතකා ගණුදෙනුකරුට ප්‍රයෝජනයට ගත හැකි ගිණුම් ඒකාබද්ධ, පේරනය හෝ හිලව් කිරීමේ මගින් අයිතිවාසිකම් සීමාවට ලක් නොකර ගණුදෙනුකරු හට ඕනෑම මුදල් ප්‍රමාණයක් හිලව් කල හැක.

8. **දැනුම්දීම්**

පාරිභෝගිකයා විසින් ගනුදෙනුකරු වෙත ලිඛිතව දැනුම් දී ඇති වෙනත් ලිපිනයකට හෝ ඉහත විශේෂිතව දක්වා ඇති ලිපිනයට දැනුම්දීම් ලබාදෙනු ඇති අතර (i) ගනුදෙනුකරු විසින් ඔහුගේ ව්‍යාපාර කාලය තුලදී ව්‍යාපාර පවත්වන දිනක නැතහොත් ලබාදෙන දිනය ව්‍යාපාර දිනයක් නොවේනම් හෝ ලබාදෙන වේලාව ව්‍යාපාර කාලය තුල නොවේනම්, ඊළඟ ව්‍යාපාර දිනයේ ව්‍යාපාර කටයුතු ඇරඹීමක් සමඟ පෞද්ගලිකව බාරදීම (ii) ව්‍යාපාර දිනයක ෆැක්ස් මඟින් දැනුම් දීම ලබාදීම සහ එසේ යැවූ ඔබට අදාල පිළිගැනීම නැතහොත් ලබාදෙන දිනය ව්‍යාපාර දිනයක් නොවේනම් හෝ ලබාදෙන වේලාව ව්‍යාපාර කාලය තුල නොවේනම්, ඊළඟ ව්‍යාපාර දිනයේ ව්‍යාපාර කටයුතු ඇරඹීමත් සමඟ සහ (iii) තැපැල් මඟින් ලබාදීමේදී තැපැල් කර ව්‍යාපාර දින දෙකකට පසුව, පාරිභෝගිකයාට එය ලැබුන බවට අනුභනය කෙරේ.

9. **ප්‍රමාද වූ ගෙවීම් සඳහා පොලිය**

යම් ගනුදෙනුවකට යටත්ව හෝ මෙම ගිවිසුම යටතේ යම් පාර්ශවයක් යම් ගෙවීමක් කිරීමට අසමත්වීමේදී, එම පාර්ශවය විසින් එම ගෙවිය යුතු දින සිට අදාල ගෙවීම අනික් පාර්ශවයට ගෙවන දින තෙක් පැහැර හැරීමේ අනුපාතයට පොලිය ගෙවිය යුතුවේ. එවැනි පොලි අනුපාතය දෛනික වැල් පොලි ක්‍රමයට ගත වී ඇති නියම දින ගණනට ගනනය කරනු ඇත.

10. **පවරාදිය නොහැක බව**

අනික් පාර්ශවයේ ලිඛිත එකඟතාවය නොමැතිව දෙපාර්ශවයටම මෙම ගිවිසුම යටතේ හිමිවන අයිතිවාසිකම් හෝ බන්ධනයන් කිසිවක් පවරාදීම හෝ මාරුකිරීම කල නොහැක වන අතර ඒ පිළිබඳව වෙනත් තුන්වන පාර්ශව අයිතිවාසිකම් ඇති කිරීමට උත්සාහයක්ද කල නොහැක.

11. **ගනුදෙනුකරු අයත් බන්ධන / අනුපාතික බලපෑම**

(i) මෙහි දැක්වෙන ගනුදෙනුකරුට අයත්වන බන්දනයන් ගනුදෙනුකරු විසින්ම පමණක් ඉටුකල යුතු වන අතර එවන් ඉටු කිරීම් ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන සියලු නීති හා රෙගුලාසින් යටත් වේ.

(ii) අනුපාතික බලපෑම් හෝ රාජ්‍යාධිකාර ක්‍රියා හේතුවෙන් ගනුදෙනුකරු හට මෙහි දැක්වෙන බන්දනයන් ඉටු කිරීමට නොහැකි හෝ ක්‍රියාවේ යෙදවිය නොහැකි තත්වයක් ඇතිවුවහොත් එවන් බන්ධන ඉටුකිරීමට ගනුදෙනුකරු හට තවදුරටත් ඉටුකල නොහැකි හෝ ක්‍රියාවේ යෙදවිය නොහැකි තත්වයක් නොමැති තත්වයක් ඇතිවන තෙක් එවන් බන්ධන අත්හිටුවිය යුතුවේ. පැහැර හැරිමකදී හේ අනෙක් පාර්ශවයට සම්බන්ධව සමාප්තිය සිදුවීමේදී අදාල බන්ධනය ඉටු කිරිම. යෝග්‍ය බවට ගනුදෙනුකරු ප්‍රකාශයක් කලහොත් සහ ඒ මඟින් එවන් තත්වයකදී එවන් බන්ධනයක අගය යම් තිලව් කිරීමට ඇතුලත් කිරීම ගනුදෙනුකරුට

පහසු වුවහොත් එම අත්හිටවූ කාලය තුල එසේ අත්හිටුවීම මත කිසිදු පොලියක් හෝ වෙනත් ගෙවීමක් (එවන් අත්හිටුවීමක් ඇති නොවූ තත්වයෙදී එවන් බන්ධනයන් මත ගෙවිය යුතුව තිබූ පොලිය හෝ වෙනත් ගෙවීමක් හැර) ගෙවිය යුතු නොවේ.

12. <u>පාලක නීති / අධිකරණ බලයට යටත්වීම</u>

මෙම ගිවිසුම සහ එය යටතේ ඇතිකර ගන්නා සබඳතාවන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නීති මගින් පාලනය වන අතර පාර්ශවකරුවන් ශ්‍රී ලංකා උසාවි වල අනන්‍ය අධිකරණ බලයට යටත් වේ.

ඊට සාක්ෂි පිණිස යථොක්ත පාර්ශවකරුවන් විසින් මෙහි පහත අනුපිලිවෙලින් විශේෂිතව සඳහන් දිනයන්හී මෙම ලියවිල්ලේ පලමුවන පිටුවෙහි සඳහන් විශේෂිතව සඳහන් දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අත්සන් තැබුවෝය.

අලෙවිකරුගේ නම විශේෂයෙන් දක්වන්න.

සෙලාන් බැංකුව පිඑල්සි

............................................................... විසින්

නම :

තනතුර :

දිනය :

(පාරිභෝගිකයා තනි පුද්ගලයෙකු වේ නම්)

අත්සන : ................................................. අත්සන : .................................................

සාක්ෂි : ................................................. සාක්ෂි : .................................................

(පාරිභෝගිකයා සංස්ථාපිත ආයතනයක් වේ නම්)

.................................................. (පුද්) සමාගමේ පොදු ලාංජනය

.................................................. දී මෙයට තබා අධ්‍යක්ෂකවරුන්

.................................................. ඉදිරියේ

අධ්‍යක්ෂක .................................................

අධ්‍යක්ෂක .................................................

පොදු මුද්‍රාව තැබූ බවට සාක්ෂි

1.

2.

හෝ

(සමාගමේ බලයලත් අත්සන්කරු කොළඹ දී) අත්සන ..............................

සාක්ෂි

1.

2.

ඇමුණුම 1

ගනුදෙනුකරුගේ ලිපි සිරස

වෙත : (පාරිභෝගික)

විසින් ගනුදෙනුකරුගේ නම :

දිනය : ....................................

විෂය : ගනුදෙනුව (යොමු අංකය) ( )

මහත්මයාණෙනි

පහත දැක්වෙන ගිවිසුම් දිනයේදී අප අතර ඇතිකරගත් ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවේ අනුදේශ හා කොන්දේසි ප්‍රකාශ කිරිම මෙම ලිපියේ අරමුණ වන අතර අප අතර ඇති කරගත් "එකී ගිවිසුම" මගින් ප්‍රති මිලදී ගැනීමේ මාස්ටර් ගිවිසුම සනාථ කිරීමක් ද සංස්ථාපනය වේ.

පහත විශේෂිතව වෙනස් කෙරෙන කරුණු හැර මෙම සනාථ කිරිම ගිවිසුමේ කොටසක්ම වන අතර අතිරේකයක් ලෙසට ගිවිසුමේ අඩංගු සියළුම විධිවිධානයන්ට යටත්ව එයින් පාලනය වේ. මෙ සනාථ කිරිමේ අඩංගු ගිවිසුමේ තේරුම් කර ඇති වචන හා වාක්‍යාංශයන් සියල්ල මෙහි මෙන්ම ගිවිසුමේ ද එකම අර්ථය දරනු ඇත.

මෙම සනාථ කිරිමෙන් සාකෂ්‍යය වන ගනුදෙනුව ලංකා සෙකුවර්හි සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම් හී සඳහන් කල යුතුවේ.

1. ගිවිසුම් දිනය : -
2. ගනුදෙනුවේ ස්වභාවය :- (ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවක්)
   (ප්‍රති නමන - ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවක්)
3. මිලදී ගත් සුරැකුම්
   (විස්තර + 1SIN ආදි අංක)
4. මිලදිගත් දිනය :
5. මිලදිගත් මිල () ශ්‍රීලංරු
6. ප්‍රති මිලදී ගැනීමේ දිනය
7. ප්‍රති මිලදි ගත් මිල
8. අමතර අනුදේශ

මෙම සනාථ කිරිමේ ලිපියේ ඒ සඳහා ඇතුලත් කර තිබෙන පිටපත සහසන් කර (පහත දැක්වෙන ලිපිනය වෙත) ආපසු එවිමෙන් පහත සඳහන් වන අදාල ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවේ අනුදේශයන් නිවැරදිව ප්‍රකාශ කෙරෙන බව කරුණාකර සනාථ කරන්න.

අපගේ ෆැක්ස් අංකය                    අපගේ ටෙලෙක්ස් අංකය

ලියකියවිලි පිළිබඳව විමසීම සඳහා අපගේ දුරකථන අංක :

ස්තුතිය

ගනුදෙනුකරුගේ නම

වෙනුවෙන්

මා / අප (ගනුදෙනුකරුගේ නම) සමඟ ඇතිකරගත් ගනුදෙනුව පිළිබඳව සත්‍ය සනාථ කිරීමේ ලිපිය මගින් නිවැරදිව පෙන්වන බව සනාථ කරමි.

(පාරිභෝගික)

දිනය :